“විශ්වාසය ශක්තිමත් මිතුදමක පදනමයි” : ඉන්දීය මහ කොමසාරිස්

*“එකට එක්ව අපට ළඟා කර ගත හැකි දේ සීමා වන්නේ අපගේ සාමූහික පරිකල්පනයෙන් පමණි”*

**1 ප්‍රශ්නය - ඉන්දියාවේ 72 වන නිදහස් දින සංවත්සරය සමරන මෙම අවස්ථාවේදී ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ජනතාවට ඔබගේ පණිවිඩය කුමක්ද?**

ඉන්දියාවේ 72 වන නිදහස් දින සංවත්සරය සමරන මෙම අවස්ථාවේදී මා මාගේ සහෝදර ඉන්දීය ජනතාවටත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මිත්‍රශීලී ජනතාවටත් මාගේ ශුභාසිංසන පිරිනැමීමට කැමතියි.

මෙම වසරේ අප්‍රේල් - මැයි කාලය තුළ ඉන්දියාවේ මහ මැතිවරණය පැවැත්වුණා. ලොව ප්‍රජාතන්ත්‍රවාදයේ විශාලතම සැණකෙළිය ලෙස හඳුන්වන මෙම මැතිවරණය සඳහා මිලියන 900කට ආසන්න ඡන්ද දායකයන් ප්‍රමාණයක් සහභාගී වුණා. වර්තමාන රජය ලැබූ සුවිශාල ජයග්‍රහණය රට ස්ථාවරත්වය වෙත යොමු කර තිබෙනවා. එසේම එයින් පිළිඹිබු වන්නේ රජයේ ප්‍රතිපත්තීන් සහ ජනතා කේන්ද්‍රීය සංවර්ධන වැඩසටහන් සඳහා ජනතාව තවදුරටත් සහයෝගය දක්වන බවයි.

අප රජයේ විදේශ ප්‍රතිපත්තියේ මූලිකාංගය වන්නේ “සැවොම එක්ව විශ්වාසයෙන් සංවර්ධනය කරා” යන්නයි. මෙය අදාළ වන්නේ ඉන්දියාවට පමණක් නොවේ. මෙය සමස්ත ලෝකය කෙරෙහිම ඉන්දියාවේ ආකල්පය වන අතර එය අසල්වැසි රාජ්‍යයන් සම්බන්ධයෙන් සුවිශේෂී වැදගත්කමක් උසුළනවා.

**2 ප්‍රශ්නය -මෑත කාලයේදී ඉන්දියා - ශ්‍රී ලංකා සම්බන්ධතාවයේ වර්ධනයන් ඔබ අර්ථ දක්වන්නේ කෙසේද?**

ශ්‍රී ලංකාව අපගේ සුවිශේෂී අසල්වැසියායි. මෑත කාලයේදී අප දෙරට අතර සම්බන්ධය වඩා වර්ධනය වී තිබෙනවා. පසුගිය වසර පහ තුළ ඉතා වැදගත් දේ සිදු වී තිබෙනවා. අප දෙරට අතර ආර්ථික සම්බන්ධතා සැලකිය යුතු ලෙස ශක්තිමත් වී තිබෙනවා. අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා පසුගිය වසර හතර තුළ තෙවතාවක් ශ්‍රී ලංකාවට පැමිණියා. 2015 මැයි මාසයේදී එතුමාගේ පැමිණීම තුළින් සටහන් වූයේ වසර 28 කට පසුව ප්‍රථම වරට ඉන්දීය අගමැතිවරයකුගේ ශ්‍රී ලංකා සංචාරයයි. 2017 මැයි මාසයේදී වෙසක් දින සැමරුමේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් එතුමා ශ්‍රී ලංකාවට පැමිණීම අප සබඳතාවයේ සන්ධිස්ථානයක් වුණා.

පාස්කු දින ප්‍රහාරයෙන් සති කිහිපයකට පසුවද ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා ශ්‍රී ලංකාවට පැමිණියේ එම ප්‍රහාරයෙන් පසුව ශ්‍රී ලංකාවට පැමිණි ප්‍රථම රාජ්‍ය නායකයා බවට පත් වෙමින්. එම සංචාරය, ඉන්දියාව අසීරු අවස්ථාවන්හිදී ශ්‍රී ලංකාව සමඟ සිටින බව අවධාරණය කරන්නක් වුණා. අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමා සිය දෙවන ධුර කාලය ආරම්භ කිරීමෙන් පසු සිදු කළ පළමු විදෙස් සංචාරයේ කොටසක් ලෙස ශ්‍රී ලංකාව තෝරා ගැනීමෙන්ද පෙන්නුම් කෙරෙන්නේ අප දෙරට අතර සම්බන්ධතාවයේ සුවිශේෂීභාවයයි. අවශ්‍ය සෑම අවස්ථාවකදීම අප අපගේ සහය ශ්‍රී ලංකා රජය වෙත ලබා දී තිබෙනවා.

ගංවතුර තත්වයක්, නියං තත්වයක් හෝ ඉන්ධන අර්බුදයක් ආදී සෑම අවස්ථාවකදීම ශ්‍රී ලංකාවේ ඉල්ලීම් වලට ප්‍රතිචාර දක්වන ප්‍රථම රාජ්‍යය බවට ඉන්දියාව පත් වී තිබෙනවා. ශ්‍රී ලංකාවට වැඩිම සංචාරකයින් ප්‍රමාණයක් පැමිණෙන රට වන්නේ ඉන්දියාවයි. ඉන්දීය සංචාරකයන් ශ්‍රී ලංකාවට පැමිණෙන්නේ කිසිදු පූර්ව කොන්දේසියකින් තොරවයි. ඔවුන් ශ්‍රී ලංකාවේ සංස්කෘතිය හා මුසු වීමට සූදානම්. ඉන්දීය විවාහ අපේක්ෂකයින් තම විවාහ මංගලෝත්සවය පැවැත්වීම සඳහා වැඩි වශයෙන් ශ්‍රී ලංකාව තෝරා ගන්නවා. එසේම ශ්‍රී ලාංකේය ශිෂ්‍ය ශිෂ්‍යාවන් වැඩි වශයෙන් සිය උසස් අධ්‍යාපනය සඳහා ඉන්දියාවේ ප්‍රමුඛ පෙළේ අධ්‍යාපන ආයතන තෝරා ගන්නවා. ඉන්දියානු

සමාගම් තවදුරටත් ශ්‍රී ලංකාව තුළ ආයෝජනයන් සිදු කරන අතර ශ්‍රී ලාංකේය සමාගම්ද ඉන්දියානු වෙළ දපොළ තුළ නව සාර්ථකත්වයන් අත් කර ගනිමින් සිටිනවා. මෙම සියලු දේ අප සම්බන්ධතාවයේ වර්ධනය වන විශ්වාසය සහ සමීපත්වය පිළිබ ද සංකේතයන්.

පුද්ගලයන් දෙදෙනෙකු  හෝ රටවල් දෙකක් අතර සම්බන්ධතාවයේ පදනම වන්නේ විශ්වාසයයි. ඔබ සියලු දෙනාම ඉන්දියාව ශ්‍රී ලංකාවට තිළිණ කළ 1990 සුවසැරිය ගිලන්රථ සේවය පිළිබඳ දන්නවා. එය මේ වන විට දිවයින පුරාම ක්‍රියාත්මකයි. අප යමක් පිළිබඳ සිතන දේ සැමවිටම සත්‍ය නොවිය හැකියි. එබැවින් නිවැරදිව යමක් දෙස බැලීම වැදගත්.

**3 ප්‍රශ්නය - ඔබ 1990 සුවසැරිය ගිලන්රථ සේවය පිළිබඳව සඳහන් කළා. ඉන්දියාව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කර ඇති අනෙකුත් සංවර්ධන ව්‍යාපෘතීන් මොනවාද?**

අප ශ්‍රී ලංකාවේ සියලු පළාත් තුළ 70 කට අධික සංවර්ධන සහයෝගිතා ව්‍යාපෘතීන් සම්පූර්ණ කර තිබෙනවා. අප මෙම සියලු ව්‍යාපෘතීන් තෝරා ගෙන සහ සකසා ඇත්තේ ශ්‍රී ලාංකේය ජනතාවගේ ප්‍රමුඛතාවයන් සිත්හි තබා ගෙනයි. ඉන්දියානු ප්‍රදාන යටතේ ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතීන් අතරින් විශාලතම ව්‍යාපෘතිය වන්නේ ඉන්දියානු නිවාස ව්‍යාපෘතියයි. අප පොරොන්දු වී තිබෙන නිවාස 63,000 අතරින් නිවාස 47,000 ක්ම ඉදිකර ප්‍රතිලාභීන් වෙත භාර දී අවසන්. මෙම වසරේදී ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය ගාල්ල, මාතර, කෑගල්ල සහ රත්නපුර යන දිස්ත්‍රික්ක වෙතද ව්‍යාප්ත කරනු ලැබුවා. එසේම අප ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයක් තුළම එක් ආදර්ශ ගම්මානය බැගින් ඉදි කරනවා. ග්‍රාමීය ජනතාවගේ ජීවිත වල සුබදායි වෙනසක් ඇති කිරීමට දායකත්වය ලබා දීමට හැකි වීම පිළිබ දව අප සතුටට පත් වෙනවා.

අප පසුගිය වසරේදී රුහුණු විශ්ව විද්‍යාලය සඳහා ශ්‍රවණාගාරයක් ඉදි කළා. එය ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලයක් සතු විශාලතම ශ්‍රවණාගරයයි. අප

නුදුරේදීම මෙට්‍රික් ටොන් 5000 ක ධාරිතාවයකින් යුත් උෂ්ණත්වය පාලනය කළ හැකි ශීතාගාරයක් දඹුල්ලේදී විවෘත කරනවා. එය අස්වනු හානි අවම කර ගැනීමට ගොවියන්ට උපකාර වනවා. ජාතික ත්‍රෛභාෂා පාසලක්ද පොළොන්නරුවේ ඉදි කෙරෙමින් පවතිනවා.

එවැනි ව්‍යාපෘතීන් 20 ක් පමණ දැනට ශ්‍රී ලංකාව පුරා ක්‍රියාත්මකයි.

**4 ප්‍රශ්නය - ඉන්දියාවේ වර්ධනයෙන් මතුවන අවස්ථාවන් පිළිබඳව ඔබ සඳහන් කර තිබෙනවා. ශ්‍රී ලංකාවට එවැනි අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ගත හැක්කේ කෙසේද?**

ඉන්දියාවේ ආර්ථික පරිණාමයේ තරම සහ වේගය පෙර නොවූ විරූ අවස්ථාවන් උදා කර දී තිබෙනවා. භූ ගෝලීය පිහිටීම සහ ඓතිහාසික බැඳීම පිළිබඳව සැලකීමේදී ශ්‍රී ලංකාවට මෙම අවස්ථාවන්ගෙන් පහසුවෙන්ම ප්‍රයෝජන ගත හැකියි.

ඉන්දියානු සමාගම්වල ගෝලීය සහ කලාපීය සැපයුම් සහ අගය දාමයන්ගේ කොටසක් බවට පත් වන ලෙස අප ශ්‍රී ලාංකේය සමාගම් දිරිමත් කරනවා. ශ්‍රී ලාංකේය සමාගම් විශේෂිත නිෂ්පාදන සඳහා අනන්‍ය නාමයක් ගොඩ නගා ගෙන තිබෙනවා. ශ්‍රී ලාංකේය සන්නාමයන් රැසක් ඉන්දියාව තුළ ප්‍රචලිත වෙමින් තිබීම පිළිබඳව මා සතුටට පත් වෙනවා. බිලියන 1.3 ක ජනකායකින් සමන්විත එක් වෙළඳපොළක් නිර්මාණය කිරීම සඳහා අප අපගේ බදු නීතීන් සරල කර තිබෙනවා. ඉන්දියාව විවිධත්ව රැසකින් සමන්විත සුවිශාල වෙළඳපොළක්. මෙම විවිධ අවශ්‍යතාවයන්ට සරිලන ලෙස සමාගම් සිය නිෂ්පාදන වෙනස් කළ යුතුයි. මෙය අභියෝගයක් මෙන්ම අවස්ථාවක්. මේ පිළිබඳ නිසි අවබෝධය ඉන්දියානු වෙළඳපොළ තුළ සාර්ථක වීමට අතිශයින්ම වැදගත්.

ඉන්දියාවේ වර්ධනයේ සහකරුවන් වන ලෙස මා ශ්‍රී ලාංකේය සමාගම් දිරිමත් කිරීමට කැමතියි. ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ අප අපට හැකි සෑම අයුරකින්ම ඔබට සහය වීමට සූදානම්.

**5 ප්‍රශ්නය - අවසාන වශයෙන්, ඔබට හැඟෙන පරිදි ඉන්දියා - ශ්‍රී ලංකා සම්බන්ධතාවය වැඩි වශයෙන් අවධානය යොමු කළ යුතු අංශ මොනවාද?**

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව පෞරාණික ශිෂ්ටාරයන් සහිත නමුත් තරුණ ජනගහනයක් සිටින රාජ්‍යයන් දෙකක්. අප දෙරටෙහිම ඉලක්කය විය යුත්තේ තාරුණ්‍යයේ සංවර්ධන අභිමතාර්ථයන් මුදුන් පමුණුවාලමින් ඔවුන්ට සෞභාග්‍යමත් සහ සුරක්ෂිත අනාගතයක් උදා කර දීමයි. මේ සඳහා අප අපගේ විශාලතම ආයෝජනය කළ යුත්තේ තරුණ පරපුර තුළයි. අප අධ්‍යාපනය සහ කුසලතා සංවර්ධනය පිළිබඳව අවධානය යොමු කළ යුතුයි. එසේම රාමුවෙන් පිටත විශාල සිහින දකින ලෙස අප ඔවුන්ට අවධාරණය කළ යුතුයි.

ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ තරුණ පරපුරට එකිනෙකාගෙන් බොහෝ දේ ඉගෙන ගත හැකි බව මට හැඟෙනවා. අප මෑතකදී ඉන්දියාව තුළම නිර්මාණය කළ චන්ද්‍රයාන් 2 නමැති යානය ස ඳ වෙත සාර්ථකව ගුවන් ගත කළා. අපට බෙදා හදා ගැනීමට සහ ඉගෙන ගැනීමට මේවා මහඟු අවස්ථාවන්. විද්‍යාව සහ තාක්ෂණය සහ අභ්‍යවකාශය යනාදී ක්ෂේත්‍රයන්හි පර්යේෂණ සහයෝගීතාවය ඉහළ නංවා ගැනීමට අප කටයුතු කළ යුතුයි.

අප, ඉන්දියාව තුළ සිය අධ්‍යාපන කටයුතු සිදු කිරීම සඳහා ශ්‍රී ලාංකේය සිසුන් 750 කට වැඩි පිරිසකට ශිෂ්‍යත්ව ලබා දෙනවා. එසේම, ITEC වැඩසටහන යටතේ විවිධ ක්ෂේත්‍රයන්හි නිරත තරුණ පිරිස් සඳහා පුහුණු අවස්ථාවන් 400 කට වැඩි ප්‍රමාණයක් ලබා දෙනවා. ඉන්දියාවේ ප්‍රමුඛතම තාක්ෂණ ආයතනයන් සඳහා ප්‍රවේශ වීමේ විභාග දැන් ශ්‍රී ලංකාවේ පවත්වනවා. ඉන්දියාවේ වෛද්‍ය විද්‍යාල සඳහා ශ්‍රී ලාංකේය සිසුන්ටත් අයදුම් කළ හැකියි.

අපට තවත් දේ කළ හැකි බව මාගේ විශ්වාසයයි. අප වැඩි වශයෙන් ආයතනික සහයෝගීතාවයන් සහ අන්තර් ක්‍රියාකාරකම් වර්ධනය කර ගත යුතුයි. කැළණිය විශ්ව විද්‍යාලය සහ දිල්ලි විශ්ව විද්‍යාලය යටතේ තිබෙන ශ්‍රී රාම් විද්‍යාලය සහයෝගීතා ගිවිසුමකට එළඹ තිබෙනවා. කොළඹ රාජකීය විද්‍යාලය සහ සනාවර් හි ලෝරන්ස් විද්‍යාලය අතර ශිෂ්‍ය හුවමාරු වැඩසටහනක් පවතිනවා. මෙ උදාහරණ කිහිපයක් පමණයි.

එසේම, කෘෂිකර්මය, උද්භිද විද්‍යාව, කිරි ආශ්‍රිත නිෂ්පාදන සහ පශු කර්මාන්තය ආදි ක්ෂේත්‍රයන්හි අපට බෙදා හදා ගත හැකි දේ බොහෝමයක් තිබෙනවා. ඉන්දියා - ශ්‍රී ලංකා සබඳතා නිර්මාණය වන්නේ, එයට මග පෙන්වන්නේ සහ එය ශක්තිමත් වන්නේ අපගේ සාමූහික අරමුණු සහ අභිමතාර්ථයන් මගින්. එකට එක්ව අපට ළඟා කර ගත හැකි දේ සීමා වන්නේ අපගේ සාමූහික පරිකල්පනයෙන් පමණයි.